# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

## සංස්ථාව සතු කාණ්ඩයේ ඉන්ධන පිරවුම්හල් සංවර්ධනය කර පවත්වාගෙනයාම සඳහා අභිලාෂ කැඳවීම

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සතු ඉන්ධන පිරවුම්හල් ජාලය ජාතික ආර්ථිකයට වඩාත් ඵලදායි ලෙස දායකකර ගැනීම සඳහා පහත ඉන්ධනහල් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ප්‍රමිතීන්ට සහ පිරිවිතරයන්ට අනුව සංවර්ධනය කර සෞඛ්‍ය, ප්‍රවේශම් හා පාරිසරික ප්‍රමිතීන්ට අනුකූලව පාරිභෝගික ජනතාවට වඩා උසස් හා කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා පවත්වාගෙන යාමට උනන්දුවක් දක්වන පාර්ශවයන් වෙතින් ඉන්ධනහල් බෙදුම්කාරත්වධුරය (Dealership) සඳහා අභිලාෂ කැඳවීමට තීරණය කර ඇත.

| | අම්බලන්ගොඩ | මුන්දලම |
|---|---|---|
| පිහිටීම | ගාල්ල දිස්ත්‍රික්කයේ-කොළඹ මාතර **A002** අම්බලන්ගොඩ නගරය | පුත්තලම දිස්ත්‍රික්කයේ-පුත්තලම කොළඹ **A003** ප්‍රධාන මාර්ගයේ මුන්දලම නගරය |
| ලිපිනය | ලංකා පිරවුම්පල, අම්බලන්ගොඩ | ලංකා පිරවුම්පල, මුන්දලම |
| ඉන්ධන පිරවුම්හලෙහි භූමි ප්‍රමාණය | පර්චස් 15.32 | පර්චස් 28.12 |
| ගොඩනැගිලි ස්වභාවය | තට්ටු 02 ක පැරණි ගොඩනැගිල්ල සහ කැනපිය | පවතින ගොඩනැගිල්ල අබලන් තත්ත්වයේ පවතින බැවින් නවීකරණ කටයුතු සිදුකල යුතුව ඇත |

**භූගත තඩාග, පොම්ප සහ සෙසු උපකරණ**

| | අම්බලන්ගොඩ | මුන්දලම |
|---|---|---|
| තනි නොසල ඉන්ධන පොම්ප | 04 යි | 03 යි |
| ද්විත්ව නොසල ඉන්ධන පොම්ප | 01 යි | 01 යි |
| ගැලුම් 3000 භූගත තඩාග | 03 යි | 01 යි (ආපදා වී ඇත) |
| ගැලුම් 2000 භූගත තඩාග | 01 යි | 03 යි (01ක් භාවිතයෙන් ඉවත් කර ඇත) |
| ඩිජිටල් වායු මීටර් | 01 යි (ආපදා වී ඇත) | 01 යි (ආපදා වී ඇත) |
| වායු සම්පීඩන යන්ත්‍ර | 01 යි | 01 යි |

**ඉන්ධන වර්ග සහ සාමාන්‍ය වාර්ෂික අලෙවි දත්ත (ලීටර් වලින්)**

අම්බලන්ගොඩ

| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ලංකා ඔටෝ ඩීසල් | 1,089,000 | 745,800 | 792,000 | 640,200 | 290,400 |
| ලංකා සුපර් ඩීසල් 4 ස්ටාර් යුරෝ 4 | 138,600 | 66,000 | 59,400 | 19,800 | - |
| ලංකා පෙට්‍රල් 92 ඔක්ටේන් | 2,257,200 | 1,980,000 | 1,993,200 | 1,524,600 | 627,000 |

මුන්දලම

| | 2019 | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|---|
| ලංකා ඔටෝ ඩීසල් | 1,069,200 | 1,973,400 | 1,801,800 | 937,200 | 290,400 |
| ලංකා පෙට්‍රල් 92 ඔක්ටේන් | 580,800 | 541,200 | 534,600 | 739,200 | 270,600 |
| ලංකා භූමිතෙල් | 422,400 | 415,800 | 534,600 | 237,600 | 85,800 |

| | |
|---|---|
| වට්ටම් හිමිවන ප්‍රතිශතය | මිලදී ගන්නා ලංකා ඔටෝ ඩීසල් සහ ලංකා පෙට්‍රල් 92 ඔක්ටේන් සඳහා 2.75 % ක්ද ලංකා භූමිතෙල් සඳහා 2.% ක් හිමිවේ. |
| දෛනික නඩත්තු හා අළුත්වැඩියා කටයුතු | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ප්‍රමිතීන්ට හා උපදෙස්වලට අදාළව බෙදුම්කරුගේ වියදමින් සිදුකරගත යුතුය. |

ඉහත කරුණු සැලකිල්ලට ගෙන මේ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් සහ ව්‍යාපාරික ආයතන වෙතින් ව්‍යාපාරික යෝජනා කැඳවනු ලැබේ. ඒ අනුව ඉහත පිරවුම්හල් සංවර්ධනය කර බෙදුම්කාරත්වය පවත්වාගෙනයාම සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන් විසින් මේ සම්බන්ධයෙන් වන ව්‍යාපාරික යෝජනා **2024 මැයි මස 10 වන දිනට ප්‍රථම** පහත ලිපිනයට ඉදිරිපත් කළ යුතු බව දැනුම් දෙමු. ඉන්ධන පිරවුම්හල් පරිශ්‍රය පරීක්ෂාකර බැලීම සඳහා අවශ්‍ය වන්නේ නම් අපගේ කළමනාකාර(ඉංජිනේරු හා පාරිශ්‍ර) 0115 455 132 අමතා දින වෙන්කරවා ගත හැකිය. වැඩිදුර තොරතුරු සඳහා

අම්බලන්ගොඩ - ප්‍රාදේශීය කළමනාකාර (දකුණ) - 091 22 34523 / 0777 440 062
මුන්දලම - ප්‍රාදේශීය කළමනාකාර (වයඹ) - 037 22 22517 / 0714 440 471

ඉදිරිපත් කරනු ලබන ව්‍යාපාරික යෝජනාවලිය තළ නඩත්තු හා අලුත්වැඩියා සම්බන්ධ ඉංජිනේරු සැලසුම්/නැවත ඉදිකිරීමේ ඉංජිනේරු සැලසුම් හා ඒ සඳහා වන මූල්‍ය ඇස්තමේන්තු (BOQ), ආයෝජන සඳහා මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරගනු ලබන ක්‍රමවේදය, මෙන්ම ආයෝජනයන් මත ලැබෙන ප්‍රතිලාභ (ROI) පිළිබඳව නිශ්චිත තොරතුරු ලේඛන හා වාර්තා මගින් තහවුරු කර තිබීම අනිවාර්ය බව සලකන්න. මේ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ඉහත ස්ථාන දෙකටම හෝ මනාපය පරිදි එක් ස්ථානයක් සඳහා අභිලාෂ ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

**නිවැරදිව සම්පූර්ණ කරනලද අයදුම්පත (වෙබ් අඩවියෙන් භාගත කරගත හැක) සමඟ අයදුම්පත්‍ර ගාස්තුව රු. 24,205.10 ක (රු 20,000.00 + වැට් + සමාජ ආරක්ෂණ බදු ද ඇතුලත්ව) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අයත් මහජන බැංකුවේ ආයතනික ශාඛාවේ ගිණුම් අංක 004100110208633 ට තැන්පත් කර අදාල බැංකු නිල ලදුපත අයදුම්පත සමඟ ඉදිරිපත් කරන්න.**

ඔබගේ යෝජනා අන්තර්ගත අභිලාෂ සම්බන්ධව ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව විසින් සිදුකරන ලබන පරීක්ෂාවෙන් අනතුරුව මූලික සුදුසුකම් සපුරා තිබේ නම් පමණක් ඉදිරි කටයුතු සඳහා අතිරේක තොරතුරු හා ලේඛන ඉල්ලා සිටින විටදී ඉදිරිපත් කිරීම අයදුම්කරුවන්ගේ වගකීමක් බව සලකන්න.

1 ඔබගේ ව්‍යාපාර ක්ෂේත්‍රය/පසුබිම පිළිබඳ හැදින්වීම.(Business Profile)
2 විගණනය කරන ලද ආසන්නතම පසුගිය ගිණුම් වර්ෂයන් 02ක ගිණුම් වාර්තා
3 අධ්‍යක්ෂවරු/ හවුල්කරුවන් සම්බන්ධ තොරතුරු
4 සාංගමික ව්‍යවස්ථාවලිය/හවුල් ව්‍යාපාර ගිවිසුම
5 ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, ආදායම් බදු හා VAT ලිපිගොනු අංකය, ආසන්නම පසුගිය වසර 02ක බැංකු වාර්ථා
6 ලේඛණ මගින් තහවුරු කරන ලද නිශ්චල හා චංචල දේපල පිළිබඳ විස්තර
7 අයදුම්කරු/ ආයතනය සම්බන්ධයෙන් පොලිස් නිශ්කාෂණ වාර්තාවක්
8 ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට මාසිකව ගෙවීමට එකඟවන බෙදුම්කාරත්ව ගාස්තුව සඳහන් එකඟතා ලිපියක්

**අලෙවි කාර්යාංශය**
**ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව**
**අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.**
**දුරකථන 0115 455 253 ෆැක්ස් 0115 455 411**

www.ceypetco.gov.lk